අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 විගණන විෂයය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත්, ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ දැක්වීම	අදහස්	නිර්දේශය
විගණන ගාස්තු වෙන් කිරීමේ ගිණුමේ ආරම්භක ශේෂය රු.328,500 ක් වූ නමුත් පෙර වර්ෂය වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ ගෙවන ලද රු.379,500 ක් වූ විගණන ගාස්තුව, විගණන ගාස්තු වෙන් කිරීමේ ගිණුමට හරකිරීම වෙනුවට විගණන ගාස්තු ගිණුමට හරකිරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් වැඩිවී තිබුණි. තව ද ඉහත ගෙවීම පෙර වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද විගණන ගාස්තු වටිනාකමට වඩා රු.51,000 ක් වැඩියෙන් ගෙවීම නිසා වන ඌණ වෙන් කිරීම පෙර වර්ෂයේ ලාභයට ගලපා නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන්	විගණනය විසින් දක්වා ඇති අඩුපාඩුව සමඟ එකඟ වන බව දන්වා තිබුණි.		නිවැරදි වටිනාකම් ගිණුම්වලට ඇතුළත් කළ යුතු ය.

දක්වා තිබුණි. මීට අමතරව ප්‍රවර්තන වර්ෂයේ අවසානයට විගණන ගාස්තු වෙන් කිරීමේ ගිණුමේ පැවතිය යුතු ශේෂය රු.400,000 ක් වුව ද, එයට වර්ෂය ආරම්භයේ පැවති රු.328,500 ක් වූ වටිනාකම ද එක්ව රු.728,500 ක් ලෙස දක්වා තිබීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන ජංගම වගකීම් රු.328,500 කින් වැඩිවී තිබුණි.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) 1646 හා 1645 (අ)	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, අධිකාරිය විසින් 2022 හා 2023 වර්ෂවල වාහන 06 ක් සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා ඉදිරිපත්කර නොතිබූ අතර, වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	සකස් කරනු ලබන වාර්තා ඊළඟ මාසයේ 15 වන දිනට පෙර අනිවාර්යයෙන්ම විගණකාධිපති වෙත යොමු කරන බව හා විගණනයේදී පෙන්වාදී ඇති ආකාරයෙන් අඩුපාඩු පවතින ස්ථාන නිවැරදි කරගැනීමට කටයුතු කරන බැව් දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ii) 315, 880 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදය	චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	මෙම අධිකාරියේ මුදල් භාරකරුවෙකු (සරජ්) පත්කර නොමැති අතර චෙක්පත් මඟින් ගනුදෙනු සිදු කරන බැවින් ඇප තැබීමක් සිදුකර නොමැති බව දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය 2 (i)	අමාත්‍යාංශයෙන් අධිකාරියට ලැබුණු ජීප්රථ දෙකක් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකාරියට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි	මෙම රථ දෙක අධිකාරියේ නමින් ලියාපදිංචි කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් සිටින බැව් දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඇ) 2022 අගෝස්තු 22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 චක්‍රලේඛය 3.9 ඡේදය හා 3.13 ඡේදය	2023 පෙබරවාරි 20 දින විදේශගත වූ නිලධාරියෙකු විසින් 2024 අප්‍රේල් මස දක්වා චක්‍රලේඛය පරිදි විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබූ අතර, භාවිතයට අපේක්ෂිත අනේවාසික විදේශ මුදල් ගිණුම පිළිබඳ විස්තර හා එහි ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට හා අමාත්‍යාංශ ලේකම්වරයාට මාසිකව වාර්තා කළ යුතු වුව ද, අධිකාරිය විසින් විදේශගත වූ නිලධාරීන් සඳහා එසේ වාර්තා පිළියෙලකර නොතිබුණි.	මුදල් ප්‍රේෂණය කරන ලෙස දන්වා සිහිකැඳවීම් ලිපි 02 ක් අදාළ නිලධාරීන් වෙත යොමුකර ඇතත්, මේ වන තෙක් ප්‍රේෂණ ප්‍රගති වාර්තා ඉදිරිපත්කර නොමැති අතර, ඉදිරි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී වාර්තා කිරීමට සැලසුම්කර ඇති බව දන්වා තිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 22,583 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.567,797 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.590,380 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම

පිරිහීමට පරිභෝජන භාණ්ඩ සැපයුම් ඉහළ යාම, අලුත්වැඩියාවන් ඉහළ යාම හා ගිවිසුම්ගත සේවාවන් සඳහා ගෙවන ලද වියදම්වල වටිනාකම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 13(1)(ඊ) උපවගන්තිය ප්‍රකාරව පනතේ 29 වන වගන්තිය යටතේ හා 2023 අංක 10 දරන පනතේ 40(1)(ඇ) යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු වුවත්, අධිකාරිය පිහිටුවා වර්ෂ 7 ක් ගත වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණු අතර, මෙම අරමුදලෙහි 2023 දෙසැම්බර් 31 දිනට රු.22,699,627 ක ශේෂයක් පැවතුණි.	නව පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ගරු අමාත්‍යතුමා විසින් වන්දි ප්‍රදානය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව කළමනාකරණ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි.	පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ 29 වගන්තිය අනුව පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ රැස්කළ දඩ මුදල් පිළිවෙලින් රු.2,876,775 ක් හා රු.2,100,600 ක් වූ අතර, පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ වියදම් ලෙස පිළිවෙලින් රු.251,025 ක් හා රු.60,456 ක් ගෙවා තිබුණි. ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන වියදම් ලෙස එකී පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව ගෙවන වන්දි සැළකෙන බැවින් ද, පනතේ 2(ඇ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයින්ට එරෙහිව වරදක් සිදු	දැනට අධිකාරිය විසින් වන්දි ගෙවීම අධිකරණ නියෝග වලට පමණක් සීමා වී ඇති හෙයින් වන්දි කමිටුව ක්‍රියාත්මක වීමෙන් පසු වන්දි ගෙවීම වඩාත් සක්‍රීය කළ හැකිවනු බව දන්වා තිබුණි.	ආදායම් රැස්කිරීමේ හා වන්දි ගෙවීමේ ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට වග බලාගත යුතු ය.

කිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගේ චින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම අධිකාරියේ අරමුණක් වන බැවින් ද, ඉහත ආදායම් රැස් කිරීම හා වන්දි ගෙවීම අවම මට්ටමක පැවතිණි.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අපරාධයක චින්දිතයින් හා සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව ලබාදීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රැකවරණ නිවාසයක් සැකසීම සඳහා 2021 දෙසැම්බර් 27 දිනැතිව වස්කඩුව ප්‍රදේශයෙන් ඉඩම සහ ගොඩනැගිල්ල රු.20,799,000 කට මිලදී ගෙන තිබුණි. ඒ සඳහා 2022 වර්ෂයේදී අවශ්‍ය ගෘහභාණ්ඩ හා අනෙකුත් උපකරණ මිලදී ගැනීමට රු.1,084,977 ක මුදලක් ද, විදුලිය සඳහා රු.7,339 ක මුදලක් ද වැයකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.965,000 ක් වැයකර නිවාසය වටා තාප්පයක් ඉදිකර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රැකවරණ නිවාසයෙහි රැකවරණය ලබා ගැනීමට පැමිණිලි 27 ක් පමණ ලැබී තිබියදීත්, වර්ෂ දෙකක පමණ කාලයක සිට මෙම නිවාසය උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතිණි.	කළ යුතු සියලු යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් මේ වනවිට අවසන් කර රැකවරණ නිවස්නය රැකවරණ අංශය වෙත බාරදී ඇති බවත්, ඔවුන් විසින් උපයෝජනයට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත් දන්වා තිබුණි .	කඩිනමින් රැකවරණ නිවාසය ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.4.2(අ) ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් චින්දිතයින්ගේ දිනය සැමරීම සඳහා කුලී පදනම මත භාණ්ඩ ලබාගැනීම, මධ්‍යම මිල සැඳහුම් කැඳවීම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල නොවන බව පිළිගන්නා අතර, මින් ඉදිරියේදි එවැනි දෑ නොවීමට වග බලාගන්නා බව දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු ය.

පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්, පොලිස් ස්ථානාධිපතිවරුන්, අධිකරණ වෛද්‍ය නිලධාරීන් හා අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, කළමණාකරන මණ්ඩලය සහ පොලිස් කොට්ඨාශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමට මිල සැඳහුම් කැඳවීම සඳහා වූ ඉල්ලීම් සම්මත පිරිවිතර සමඟ යවා නොතිබුණි.		
(ආ) එම සංග්‍රහයෙහි 2.11.3(අ) ඡේදය ප්‍රකාරව මධ්‍යම පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්, පොලිස් ස්ථානාධිපතිවරුන් හා අධිකරණ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට අදාළව පැවති තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව නිශ්චිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත්කර නොතිබුණි.	තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා නිශ්චිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් නොකර ඇති බැව් පිළිගන්නා බවත්, මින් ඉදිරියට එවැනි දෑ සිදු නොවීමට වග බලා ගන්නා බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල කටයුතු කරන බවත් දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු ය.
(ඇ) එම සංග්‍රහයෙහි 6.3.3(අ) ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ වගකීම ප්‍රසම්පාදන කමිටුව වෙත පැවරී ඇති අතර, ප්‍රසම්පාදන කමිටුව විසින් එම අධිකාරිය ලංසු විවෘත කිරීමේ කමිටුව වෙත පවරනු ලැබිය හැකි ය. එම කමිටුව අවම වශයෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුව ද, ජාතික අධිකාරිය සතු රැකවරණ නිවස වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීමට අදාළව ලැබී ඇති මිල ගණන් විවෘත කිරීම සඳහා වන කමිටුව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පමණක් පත්කර තිබුණි.	මේ වනවිට විගණනයේදී පෙන්වාදී ඇති පරිදි ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත මිල ගණන් විවෘත කිරීමේ කමිටු පත්කර මිල ගණන් විවෘත කිරීම සිදුකරන බව දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු ය.
(ඈ) එම සංග්‍රහයෙහි 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘතිපත්‍රයක වාර්තාගත කළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතු නමුත්,	විගණනයේදී පෙන්වාදී ඇති කරුණ සත්‍ය බව පිළිගන්නා අතර, ඉදිරි කටයුතුවලදි විගණනය පෙන්වාදී ඇති පරිදි නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු ය.

රැකවරණ නිවස වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීමට අදාළව ලංසු විවෘත කිරීමේ රැස්වීමේදී එසේ කර නොතිබුණි.		
(ඉ) එම සංග්‍රහයෙහි 5.6.1(අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදනයට ඇති භාණ්ඩ හෝ සේවා සඳහා වන පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු යැයි සඳහන් වුව ද, දකුණු පළාතේ නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා ස්ථානයක් තෝරා ගැනීමට මිලගණන් කැඳවීම සඳහා සැකසූ ලිපියෙහි අදාළ පිරිවිතර පිළිබඳව පැහැදිළිව දක්වා නොතිබුණි.	මූලික අවශ්‍යතාවයන් හඳුනාගෙන පිරිවිතරයන් සකස් කළ ද, සවිස්තරාත්මකව සඳහන් කිරීමට නොහැකි වූ බව පිළිගන්නා අතර, ඉදිරියේදී මෙවැනි දෑ සිදු නොවීමට කටයුතු කරන බැව් දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු ය.
(ඊ) බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ පැවැත් වූ කොළඹ මහාධිකරණ නීතිඥවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කාර්යයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනයකර නොතිබුණි.	විද්‍යුත් තැපෑල මාර්ගයෙන් මිල ගණන් ලබාගෙන ඇති අතර, එම ක්‍රමවේදය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල නොවන බව පිළිගන්නා අතර, මින් ඉදිරියේදී එවැනි දෑ සිදු නොවීමට කටයුතු කරන බැව් දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු ය.

3.4 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල් යටතේ පළමු වාරිකය ලෙස රු.මිලියන 12.833 ක් අධිකාරියට ලැබී තිබුණු අතර, වර්ෂය තුළදී රු.මිලියන 9.1973 ක මුදලක් වැයකර තිබුණි. මෙම පළමු වාරිකයෙන් රු.මිලියන 3.6357 ක් හෙවත් ලැබුණු අරමුදල්වලින් සියයට 28 ක් දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණි. මෙම වැඩසටහන සඳහා පිළියෙලකර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි පළමු වාරිකය 2023 ජූනි 30 දිනෙන් අවසන් වන අතර, 2 වන වාරිකය වන	මෙම ප්‍රතිපාදන අධිකාරියේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් අංශය විසින් කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වන බවත්, ඒ සඳහා ප්‍රමාණවත් පිරිස් බලයක් නොමැති බවත්, එම නිසා දෙවන වාරිකය අධිකාරියට ලබාගැනීමට 2023 වර්ෂය තුළදී නොහැකි වූ බවත් දන්වා තිබුණි.	අදාළ පුරප්පාඩු පුරවා ආයතනයේ කටයුතු කාර්යක්ෂම කරගෙන යාමට කටයුතු කළ යුතු ය.

	රු.මිලියන 13.1188 ක මුදලක් 2023 ජූලි සිට දෙසැම්බර් දක්වා වෙන්කර තිබුණ ද, පළමු වාරිකය වියදම්කර අවසන්කර නොතිබීම හේතුවෙන් එම දෙවන වාරිකය 2023 දෙසැම්බර් 31 දින දක්වා ලබාගැනීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි.	

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 56 ක් වුව ද, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 30 ක් විය. ඒ අනුව අධිකාරියෙහි පරිපාලන කටයුතු වෙනුවෙන් සෘජුවම දායකවන තනතුරු 34 කින් තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතිණි.	රජයේ වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ බඳවාගැනීම් රෙගුලාසිවලට යටත්ව මේ වන විට බඳවාගැනීම් සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වසර ආරම්භයේදී අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල්වලට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කර නොතිබූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල්වලින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් 04 ක් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබූ අතර, එම ක්‍රියාකාරකම් 4 සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල්වලින් රු.මිලියන 4.673 ක් ඇස්තමේන්තුකර තිබුණ ද, රු.මිලියන 2.1043 ක් වැයකර ක්‍රියාකාරකම් 3 ක් සමාලෝචිත වර්ෂයේදී නිමකර තිබුණි.	ඇස්තමේන්තු කරන ලද මුළු මුදලම වියදම් නොවීම, සහභාගිවූවන්ගේ ගණන අඩුවීම, ලංසු ඉදිරිපත් කරන ලද ආයතන වෙතින් අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය වෙත ප්‍රසම්පාදන අනුමැතිය ලබාදීම නිසා ඇස්තමේන්තු කළ මුදලට වඩා සත්‍ය වියදම් කළ මුදල අඩු වූ බව දන්වා තිබුණි .	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ එකතුව රු.මිලියන 9.391 ක් වූ ක්‍රියාකාරකම් පහක් වර්ෂය තුළ ක්‍රියාවට නංවා නොතිබුණි.	තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු අධිකාරිය සතුව නොමැති වීම හේතුවෙන් හා දෙවන වාරිකය අධිකාරිය වෙත නොලැබීම හේතුවෙන් සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි.	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු ය.
(ඇ) ඇස්තමේන්තුව නිසියාකාරව පිළියෙලකර නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරකම් දෙකක් සඳහා ඇස්තමේන්තු කරන ලද මුදලින් සියයට 50 වඩා වැඩි ප්‍රතිශතයක් ඉතිරිවී තිබුණි.	අත්‍යාවශ්‍ය නිලධාරින්හට පමණක් නවාතැන් පහසුකම් ලබාදීම, නොමිලේ ශාලා පහසුකම් ලබාගැනීම සහ අවම වියදමෙන් ආහාරපාන ලබාගැනීම යන හේතු නිසා ඇස්තමේන්තු කළ මුදලට වඩා සත්‍ය මුදල අඩු වූ බව දන්වා තිබුණි.	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු ය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 ප්‍රකාරව රාජ්‍ය වියදම් දැඩිව පාලනය කළ යුතු වුවත්, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් අටක් පැවැත්වීම සඳහා රු.4,429,828 ක් වැයකර තිබූ අතර, ස්ථානයක් තෝරාගැනීමේදී රජයේ ආයතනවල පවතින නවාතැන් සහ දේශන ශාලා පිළිබඳව විමසීමක් සිදුකිරීමකින් තොරව පෞද්ගලික හෝටල්වලට විශාල වියදමක් දරා පවත්වා තිබුණි.	මින් ඉදිරියේදී හැකිතාක් පහසුකම් සහිත රජයේ ආයතන වල පවතින නවාතැන් සහ දේශන ශාලා භාවිතා කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	චක්‍රලේඛවලට අනුගතව ක්‍රියා කළ යුතු ය.